අධ්‍යාපන, ක්‍රීඩා, සංස්කෘතික කටයුතු, පෙර පාසල් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ අධ්‍යාපන,
යෞවන කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය
නැගෙනහිර පළාත
கல்வி, விளையாட்டு, பண்பாட்டலுவல்கள், முன்பள்ளிக்கல்வி, தகவல் தொழிநுட்பக்கல்வி,
இளைஞர் விவகாரம்,புனர்வாழ்வுமற்றும் மீள்குடியேற்றஅமைச்சு
கிழக்குமாகாணம்
Ministry of Education, Sports, Cultural Affairs, Pre School Education,
Information Technology Education, Youth Affairs, Rehabilitation & Resettlement
Eastern Province

ත්‍රිකුණාමලය　திருகோணமலை　Trincomalee

මගේ අංකය / எனது இல. / **My No.** — EP/3/1/R1/27/2021
ඔබේ අංකය / உமது இல. / **Your No.** —
දිනය / திகதி / **Date** — 2022.04.27

මාධ්‍ය නිවේදනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීය ඩිප්ලෝමාධාරින්හට ගුරු පත්වීම් ප්‍රදානය කිරීම නැගෙනහිර පළාත් සභාව

2017/2019 අධ්‍යයන වර්ෂයේ ජාතික අධ්‍යාපන විද්‍යාපීයවලින් පිටවූ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සදහා එළඹෙන 2022.05.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දීමට නියමිතය. මෙම පළාතේ පාසල්වල පත්වීම් ලබා ගැනීමට නියමිත ඩිප්ලෝමාධාරින් තමන්ගේ පත්වීම් සම්බන්ධයෙන් තොරතුරු නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන **https://www.ep.gov.lk/en/minieducationindex** මගින් දැනගත හැකිය.

රටේ පවත්නා වත්මන් තත්වය අනුව පත්වීම් ප්‍රදානය සදහා උත්සව පැවැත්වීමට අදහස් නොකරන බැවින් පත්වීම්ලාභීන් මෙම අමාත්‍යාංශය වෙත කැදවා පත්වීම් ලිපි නිකුත් කිරීමට අපේක්ෂා කරමි. එම පත්වීම් ලිපි නිකුත් කිරීම 2022.05.02 දින පෙ.ව.9.30ට ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලයේ පිහිටි නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේදී සිදු කිරීමට නියමිත බැවින් සියලුම පත්වීම්ලාභීන් පෞද්ගලිකව පැමිණ සිය අනන්‍යතාවය තහවුරු කොට (ජාතික හැදුනුම්පත/ රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය) පත්වීම් ලිපිය ලබාගත හැකිය. ඔවුන් වෙනුවෙන් සහභාගී වන නියෝජිතයන්හට පත්වීම් ලිපි නිකුත් කිරීමට අදහස් නොකරන අතර, නොවැළැක්විය හැකි කරුණක් මත පැමිණිය නොහැකි අයෙකු ඉතාම විශ්වාසවන්ත අයෙකු වෙත බලය පැවරීමේ ලිපියක් සමග අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පමණක් පත්වීම් ලිපිය ලබාගත හැකිය. එවැනි අවස්ථාවකදී අස්ථානගත වන පත්වීම් ලිපි සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්.

H.E.M.W.G. DISSANAYAKE
Secretary
Ministry of Education, IT Education, Pre [illegible]tion
Sports, Cultural Affairs, Yo[illegible] and
Rehabilitation & [illegible]ent
Eastern Province

Inner Harbour Road,
Trincomalee.
General : 026 – 2222176
Fax : 026 – 2222730
Asst. Secretary : 026 –2052110
AO : 026 –2223223

உட்துறைமுகவீதி,
திருகோணமலை
Secretary : 026 – 2220035
Accountant : 026 – 2221015
Dire.of School Works : 026 – 2220087
Email : mineducation@ep.gov.lk

ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය
Senior Asst. Secretary : 026 –2224023
Dire.of Planning : 026– 2222723
Deputy Dire. of Edu. : 026 – 3135501